## විශේෂ සටහන 2

## කොවිඩ්-19 සහ ශ්‍රී ලංකාව: අභියෝග, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ඉදිරි දැක්ම

2019 වසරේ අවසානයේ දී චීනයේ ප්‍රථම වරට අනාවරණය වූ කොවිඩ්-19 වෛරසය ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත වූ අතර 2020 මාර්තු මැද භාගය වන විට ලෝක සෞඛ්‍ය සංවිධානයට එය වසංගත තත්ත්වයක් ලෙසට ප්‍රකාශයට පත්කිරීමට සිදුවිය. අද වන විට, මෙම වසංගතය සෑම රටකම මානව ප්‍රජාවට හා ආර්ථිකයන්ට පෙර නොවූ විරූ බලපෑමක් සිදු කර ඇත. අප්‍රේල් මැද භාගය වන විට ලොව පුරා මිලියන 2.5ක ජනතාවකට මෙම වෛරසය ආසාදනය වී ඇති අතර, ඉන් 150,000කට වඩා මියගොස් ඇති අතර, දැනට සිදු වෙමින් පවතින "ලෝක සමාජ-ආර්ථික අක්‍රීයතාව" (Great Lockdown) නිසා ඇති විය හැකි ආර්ථික ප්‍රතිවිපාක 2007-08 ගෝලීය මූල්‍ය අර්බුදය ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කෙරේ. විවිධ අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ ලොව පුරා ප්‍රතිපත්ති සම්පාදකයින් මෙම අර්බුදකාරී තත්ත්වයට මුහුණ දීමට ප්‍රයත්න දරමින් සිටී. ශ්‍රී ලංකාව මේ වන විට වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා අනුගමනය කළ මුල් ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස යම් සාර්ථකත්වයක් ලබා සිටින අතර, එම ක්‍රියාමාර්ගයන් තුළින් දේශීය ආර්ථික කටයුතුවලට ඇතිවන පසුබෑම සහ ගෝලීය ආර්ථිකයේ මන්දගාමී වීම තුළින් ඇති විය හැකි බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත.

### ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 පැතිරීම සහ පාලනය කිරීම

2020 මාර්තු 11 වන දින දක්වා ශ්‍රී ලංකාවේ ආසාදිතයින් ගණන එක් පුද්ගලයෙකුට පමණක් සීමා වූ නමුත් එම සංඛ්‍යාව වේගයෙන් 50 දක්වාත්, පසුව අප්‍රේල් මැද භාගය වන විට තහවුරු වූ රෝගීන් 300ක් දක්වාත් වැඩි වූ අතර ජීවිත හානි 7ක් වාර්තා විය. මෙම වෛරසය පිළිබඳ සිදු කළ දැනුවත් කිරීම් මගින් මාර්තු මාසයේ මුල් කාලපරිච්ඡේදය තෙක් එහි ව්‍යාප්තිය වළක්වා ගැනීමට හැකි වුවද, සංචාරකයින්ගේ අඛණ්ඩ පැමිණීමත්, වෛරසය ව්‍යාප්ත වී තිබූ රටවලින් ශ්‍රී ලාංකිකයන් නැවත පැමිණීමත් හා මාර්තු මැද සිට පනවන ලද ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ දී පැවති දුර්වලතාවයනුත් නිසා වෛරසයේ ව්‍යාප්තිය තවදුරටත් වැඩි විය. එසේ වුවද, රට තුළ පොලිස් ඇඳිරිනීතිය පැනවීම මගින් මිනිස් ක්‍රියාකාරකම් සීමා කිරීම, 2020 මාර්තු 19 සිට ගුවන් තොටුපලවල් වසා දැමීම සහ විදේශයන්ගෙන් පැමිණෙන්නන් නිරෝධායනය කිරීමට ගත් ක්‍රියාමාර්ග තුළින් වෛරසයේ ව්‍යාප්තිය බොහෝ දුරට පාලනය කිරීමට උපකාරී වූ අතර, එය හඳුනාගත් ප්‍රදේශ කිහිපයකට එනම් ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාතේ ප්‍රදේශ කිහිපයක් සහ පුත්තලම සහ යාපනය දිස්ත්‍රික්කවල ප්‍රදේශ කිහිපයක් තුළට සීමා විය. කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා රජය ඉහළ මට්ටමේ ඒකක දෙකක් පිහිටුවන ලද අතර එමගින් සමාජ දුරස්ථතාවයට පනවා ඇති සීමාවන් මධ්‍යයේ මහජනයා මුහුණ දෙන දුෂ්කරතා සමනය කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය මගින් මහජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව සහ වෙනත් සේවාවන් සැපයීම සහතික කිරීමට ක්‍රියාමාර්ග ගන්නා අතරම, වෛරසයේ ව්‍යාප්තිය වැළැක්වීමේ සහ කළමනාකරණ පියවර සම්බන්ධීකරණය ද කරනු ලබයි. ජනාධිපති කාර්යසාධක බලකාය විසින් අත්‍යවශ්‍ය සේවාවන් අඛණ්ඩව සැපයීමට අදාළ මඟපෙන්වීම්, සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම සිදු කරන අතර එහිදී අඩු ආදායම්ලාභී පවුල් සහ සමාජයේ අවදානමට ලක්විය හැකි පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

දේශීය ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීමේ අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කරමින් සමාජ-ආර්ථික අක්‍රීයත්වයෙන් මිදීම සඳහා අවශ්‍ය උපායමාර්ග රටපුරා ක්‍රියාත්මක කෙරෙමින් පවතී. ඇඳිරිනීතිය පැනවීමේ කාලසීමාව අඩුකිරීම, සේවා ස්ථාන සහ ව්‍යාපාර අවම කාර්ය මණ්ඩලයක් සහිතව පවත්වාගෙන යෑම, හැකිතාක් දුරට සේවා පරිසරයෙන් දුරස්ථව රාජකාරී කටයුතු කිරීම සහ මාර්ග හා දුම්රිය ප්‍රවාහන සේවා නැවත ක්‍රමානුකූලව ආරම්භ කිරීම වැනි ක්‍රියාමාර්ග සඳහන් කළ හැකිය. මහජනයා විශාල ලෙස රැස්වීමේ තත්ත්වයන් මත ඇති කළ තහනම යම් දීර්ඝ කාලයක් සඳහා පවතිනු ඇත.

### ශ්‍රී ලංකාවට කොවිඩ්-19 වසංගතයේ ආර්ථික බලපෑම

වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග, එහි පැතිරීම මැඩපැවැත්වීමට උපකාරී වුවද, එමගින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු ඍණාත්මක බලපෑමක් ඇති කර තිබේ. මහජනතාව සඳහා නිවාඩු ප්‍රකාශයට පත් කිරීම, ඇඳිරි නීතිය පැනවීම, මහජන සේවා සීමිතව පවත්වාගෙන යෑම සහ ගුවන්තොටුපළ සහ වරාය වසා දැමීම වැනි මගීන්ගේ ගමනාගමනය සීමා කිරීමට ගනු ලැබූ වෙනත් ක්‍රියාමාර්ග මගින් ප්‍රධාන ආර්ථික අංශ කිහිපයකට බලපෑම් ඇති කරනු ඇත. සමාජයේ විශාල කොටසකට ආදායම් හා ජීවනෝපායන් අහිමිවීම සමග ඇති විය හැකි සමාජ-ආර්ථික බලපෑමද ඉහළ යා හැකිය. ආසන්න වශයෙන් සේවා නියුක්ත පුද්ගලයින්ගෙන් සියයට 60ක් පමණ රැකියා කිරීම සහ දෛනික වැටුප් උපයන්නන් මිලියන 1.9ක් පමණ ඇති බවට ඇස්තමේන්තු කර ඇති බැවින්, විශාල පුද්ගල සංඛ්‍යාවක් දුෂ්කරතාවන්ට මුහුණ දීමට ඉඩ තිබේ. ජනගහනයේ අනෙකුත් අවදානමට ලක්විය හැකි කොටස් වන වැඩිහිටියන් සහ දරිද්‍රතා සීමාවට ඉහළින් ඊට ආසන්නයේ ජීවත් වන විශාල පිරිසක් මෙම තත්ත්වයෙන් අධික ලෙස බලපෑමට ලක් වීමට ඉඩ ඇත. වෛරසයේ ව්‍යාප්තිය මැඩලීම සඳහා මුල් අවස්ථාවේ දී ම ගන්නා ලද

පියවර හේතුවෙන් ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය සේවා පද්ධතියට සැලකිය යුතු පීඩනයක් ඇති නොවුන ද, වෛරසයේ පැතිර යෑම අනපේක්ෂිත ලෙස ඉහළ ගියහොත්, එමගින් මහජන සෞඛ්‍ය සේවා පද්ධතියේ සීමිත ධාරිතාවයට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය.

ගෝලීය ආර්ථිකය 1930 දශකයේ ඇති වූ ලෝක ආර්ථික අවපාතයෙන් පසු දරුණුතම පසුබෑමට මුහුණ දෙමින් සිටියි. එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, යුරෝපීය කලාපය සහ ජපානය වැනි බොහෝ දියුණු ආර්ථිකයන් 2020 දී ඍණ ආර්ථික වර්ධන වේගයන් වාර්තා කරනු ඇත. චීනය සහ ඉන්දියාව ඇතුළු ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ද සැලකිය යුතු ආර්ථික පසුබෑමකට ලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය වෙළඳ භාණ්ඩ වෙළඳාම 2020 දී සියයට 32කින් පමණ මන්දගාමී විය හැකි බව ලෝක වෙළඳ සංවිධානය (WTO) පුරෝකථනය කරයි. ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ දුර්වල ආර්ථික ක්‍රියාකාරිත්වය නිසා ඉල්ලුම දුර්වල වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ අපනයන ආදායමට සෘජුවම බලපෑම් ඇති විය හැකි අතර, වෛරසයේ පැතිරයෑම සහ කෙටිකාලීන ආර්ථික බලපෑම අවම කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් ගනු ලබන විවිධ ක්‍රියාමාර්ග තුළින් සැපයුම් දාම සඳහා බලපෑම් එල්ල විය හැකි අතර, එමගින් රටේ වර්තමාන හා අනාගත අපනයන ධාරිතාවට බලපෑම් ඇති විය හැක.

පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු සංචාරක අංශය වේගයෙන් යථා තත්ත්වයට පත් වුවද, මෙම කොවිඩ්-19 වසංගතය නිසා සංචාරක අංශය බෙහෙවින් පසුබෑමට ලක් විය හැකි අතර ඉන් පසුව ද යම් දිගුකාලීන හා කල් පවතින ගැටලු සඳහා මුහුණ දීමට සිදු වනු ඇත. ගෝලීය ආර්ථිකයේ සමස්ත පසුබෑම සහ චීනය, ඉන්දියාව සහ යුරෝපය ඇතුළු ශ්‍රී ලංකාව සාම්ප්‍රදායිකව සංචාරකයින් ආකර්ෂණය කරගෙන ඇති රටවල් සහ කලාපවල ආර්ථික දුෂ්කරතා සංචාරක අංශය යථා තත්ත්වයට පත් වීමට බාධා ඇති කරනු ඇත. තවද, ගෝලීය සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින් වෛරසයේ “දෙවන ව්‍යාප්තියක්” ඇති වීමේ හැකියාවක් පිළිබඳව නිරන්තරයෙන් අවධානය යොමු කරන අතර එමගින්, වසංගතය තුරන් වූවායින් පසුව වුවද “සමාජ දුරස්ථතාවය” මාස කිහිපයක් පුරා පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව අවධාරණය කරයි. එබැවින් සංචාරය කිරීම හා සම්බන්ධ පාරිභෝගික ආකල්පවල සැලකිය යුතු ඍණාත්මක වෙනසක් සිදු වුවහොත් සංචාරක කර්මාන්තයේ මෙම අකර්මන්‍ය ස්වභාවය බොහෝ කලක් පවතිනු ඇත.

ගෝලීය ආර්ථිකය සංකෝචනය වීමේ තවත් මූලික බලපෑමක් ලෙස, ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මත හිතකර බලපෑමක් ඇති කරන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්වල ද යම් පහළ යෑමක් ඇති විය හැකිය. මෑත වසරවල දී, ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්හි මූලික මූලාශ්‍ර ලෙස මැද පෙරදිග, යුරෝපා සංගමය සහ ඈත පෙරදිග ආසියාව දැක්විය හැකිය. කොවිඩ්-19 ව්‍යාප්තිය යුරෝපය සහ පෙරදිග ආසියාවට සැලකිය යුතු ලෙස බලපා ඇති අතර, මැදපෙරදිග කලාපයට මෙම වසංගතය පමණක් නොව, ගෝලීය බොරතෙල් ඉල්ලුම දුර්වල වීම සහ ඔපෙක්+ (OPEC+) සන්ධානයේ ඇති වූ ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් ජාත්‍යන්තර බොරතෙල් මිල හදිසියේ පහත වැටීම ද බලපා ඇත. මෙම තත්ත්වය තුළ, ඉන්ධන ආනයන පිරිවැය පහළ යෑම මගින් ශ්‍රී ලංකාවේ වෙළඳ හිඟය මත යම් හිතකර බලපෑමක් සිදු කළ ද, භාණ්ඩ හා සේවා අපනයන ආදායම් සහ සේවා නියුක්ති ප්‍රේෂණවල ලැබීම්හි අපේක්ෂිත පහළ යෑම විදේශීය අංශයේ ජංගම ගිණුම මත ඇති කරන සමස්ත බලපෑම 2020 දී ඍණාත්මක වනු ඇත.

මෙම ආර්ථික දුර්වලතා මධ්‍යයේ බොහෝ රටවල් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයන් ක්‍රියාත්මක කළ අතර, මූල්‍ය අංශය හරහා පුද්ගලයින් හා ව්‍යාපාර වෙත ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ලබා දීම සහතික කිරීම සඳහා සාම්ප්‍රදායික නොවන මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය කරමින් සිටී. එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය පොලී අනුපාතික පහළ මට්ටමක පැවතීම නිසා ශ්‍රී ලංකාව වැනි රටවල ණය ආපසු ගෙවීමේ ප්‍රතිමූල්‍යකරණ පිරිවැය පහළ යා හැකිය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව ඇතුළු නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්ගේ දක්නට ලැබෙන ප්‍රාග්ධන ප්‍රවාහ ආපසු ගලායෑම් මගින් එවැනි ධනාත්මක ප්‍රතිඵලවල බලපෑම මෙතෙක් නිශේධනය වී ඇත. කෙටිකාලීන ප්‍රාග්ධන ප්‍රවාහයන් ශ්‍රී ලංකාවේ නිරාවරණය වීම ඉතා සුළු වුවද, එමගින් අනෙකුත් නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල්හි දක්නට ලැබෙන ආකාරයට, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ඵලදා අනුපාතික ද තියුණු ලෙස ඉහළ ගොස් ඇත. මීට අමතරව, මෙම වසංගත තත්ත්වය නිසා ඇති වන අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ ලොව පුරා විදේශ සෘජු ආයෝජන ප්‍රවාහයන් කෙරෙහි විශාල ලෙස බලපෑම් සිදු වන අතර, එමගින් ණය නොවන ප්‍රාග්ධන ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාවේ අවස්ථාවන්ට ද කෙටිකාලීන වශයෙන් අහිතකර ලෙස බලපානු ඇත.

එබැවින්, ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වන අතිරේක මූල්‍ය සම්පත් යෙදවීම ඇතුළුව, විවිධ සෘජු හා වක්‍ර මාර්ග ඔස්සේ කොවිඩ්-19 වසංගතය ආර්ථික වර්ධනය කෙරෙහි පෙර පැවති ධනාත්මක අපේක්ෂාවන්ට පටහැනිව, මෙම වසර තුළ දී අහිතකර ලෙස බලපානු ඇත. ඒ අනුව, මැදිකාලීනව ආර්ථික වර්ධනය එහි විභව මට්ටමට ළඟා වීමට පෙර මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2020 වසරේ දී සියයට 1.5ක් දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම

ලොව පුරා වෙනත් රටවලට සමානව ශ්‍රී ලංකාව ද කොවිඩ්-19 වසංගතය සහ එහි බලපෑම අවම කිරීම සඳහා තුන් ආකාරයක ප්‍රතිපත්ති භාවිතා කර ඇත. එනම්: අ) රට තුළට ප්‍රවේශ වීම පාලනය කිරීම සහ සෞඛ්‍ය අංශ පිළිබඳ ප්‍රතිපත්ති; ආ) රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග; සහ ඇ) ප්‍රාග්ධන

ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ඇතුළුව මුදල් හා මූල්‍ය අංශයේ පියවර වේ. රට තුළට ප්‍රවේශ වීම පාලනය කිරීම සහ සෞඛ්‍ය අංශ පිළිබඳ ප්‍රතිපත්ති මගින් වසංගතය පැතිරීම පාලනය කිරීමට උත්සාහ කරන අතර රජය සහ මහ බැංකුව විසින් අනුගමනය කරන ලද අනෙකුත් ප්‍රතිපත්ති මගින් වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාරිකයින්ට සහ පුද්ගලයින්ට සහන සැලසීම මගින් ඇති විය හැකි සාර්ව ආර්ථික ගැටලු මඟහැරවීමට අරමුණු කෙරේ.

මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගත් කල, ශ්‍රී ලංකා මහ බැංකුව, මේ වන විට ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් අංක 100කින් අවස්ථා තුනක දී අඩු කර ඇත. ඉන් අවස්ථා දෙකක් 2020 මාර්තු සහ අප්‍රේල් මාසවල හදිසි සමාලෝචන මගින් සිදු කරන ලදී. බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලු රුපියල් තැන්පතු වගකීම් පිළිබඳ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.00කින් අඩු කර ඇති අතර එමගින් රුපියල් බිලියන 65ක ස්ථිර ද්‍රවශීලතාවක් වෙළඳපොළට මුදා හැර ඇත. මූල්‍ය ආයතන සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් ලබා දීමට ආර්ථිකයේ හදිසි මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් පහසුකම් සැලසීමට, විවිධ වර්ගවල හා කල්පිරීම් සහිත විවට වෙළඳපොළ කටයුතු හරහා දේශීය මුදල් වෙළඳපොළේ විශාල ද්‍රවශීලතා අතිරික්තයක් පවත්වා ගෙන යනු ලැබේ. මේ අතර, 2020 අප්‍රේල් මාසයේ දී මහ බැංකුව විසින් හදිසි අවස්ථාවල දී යොදා ගත හැකි පරිපාලනමය වශයෙන් තීරණය කරනු ලබන අනුපාතිකයක් වන බැංකු අනුපාතිකය පදනම් අංක 500කින් සියයට 15.00 සිට සියයට 10.00 දක්වා අඩු කරන ලදී.

වසංගතය පැතිර යෑම සහ එය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග නිසා අපහසුතාවයට පත් වන ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා පහසුකම් සැලසීමට මූල්‍ය අංශයේ පියවර කිහිපයක් ගෙන ඇත. සංචාරක, වැවිලි හා තොරතුරු තාක්ෂණ හා ඇඟලුම් අංශ ආශ්‍රිත සැපයුම්කරුවන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා පුළුල් පරාසයක ණය පමා සහනයක් ප්‍රකාශයට පත් කර ඇත. මෙම ව්‍යාපාරවලට කාරක ප්‍රාග්ධන ණය සහ ආයෝජන අරමුණු සඳහා වන ණය පහසුකම් සහනදායී පොලී ප්‍රතිශත යටතේ ලබා ගත හැකිය. ත්‍රිරෝද රථ සඳහා ලීසිං ණය සහ කුඩා වටිනාකමින් යුත් පුද්ගලික බැංකු ණය සහ ලීසිං ණය සඳහා ද ණය පමා සහනයක් ලබා දී ඇත. මීට අමතරව, අක්‍රීය ණය සඳහා නැවත පහසුකම් සලසන ලෙසට මූල්‍ය ආයතනවලින් ඉල්ලා ඇත. මෙම සහන ලබා දීම පහසු කරලීම සඳහා අඩු පොලී අනුපාත යටතේ ද්‍රවශීලතා සැපයීමට අමතරව, අඩු ප්‍රාග්ධන සංරක්ෂණ ආවරණ අවශ්‍යතා සහ ණය වර්ගීකරණ නීති ලිහිල් කිරීම ප්‍රකාශයට පත් කර ඇත. බලපෑමට ලක්වූ ව්‍යාපාරවලට ඔවුන්ගේ ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා කාරක ප්‍රාග්ධනය සපයන 'සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද පහසුකම (Saubagya COVID-19 Renaissance Facility)' හඳුන්වාදීම ඇතුළු වෙනත් පියවර රාශියක් ගෙන ඇත. අවම පොලී අනුපාත යටතේ 'නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (New Comprehensive Rural Credit Scheme)' මගින් බලපත්‍රලාභී බැංකු හරහා ගොවීන්ට උප ණය නිකුත් කිරීමට ද නියමිතය.

මීට අමතරව, ගෙවුම් තුලනය සහ විනිමය අනුපාතික මත ඇතිවන පීඩනය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. ඒ අනුව, වර්ග කිහිපයක මෝටර් රථ සහ අනෙකුත් අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා පහසුකම් සැලසීම අත්හිටුවීමට බලපත්‍රලාභී බැංකු වෙත නියෝග නිකුත් කරන ලදී. එමෙන්ම, දේශීය ආයෝජකයින් විසින් කරනු ලබන විදේශ ආයෝජන නැවැත්වීම සහ වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම තහනම් කිරීම ඇතුළු විදේශ විනිමය පිටතට ගලායෑම් තාවකාලිකව නැවැත්වීමට ද පියවර ගන්නා ලදී. තවද, විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින්ගෙන් සහ මුදල් එවීමට කැමති වෙනත් අයවලුන්ගෙන් ලැබෙන විදේශ මුදල් සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් 'විදේශ තැන්පතු ගිණුමක්' හඳුන්වා දෙන ලදී.

මේ අතර පසුබෑමට ලක්ව තිබූ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණින් ජනාධිපතිවරණයෙන් පසුව ව්‍යාපාරවලට ලබා දී තිබූ සැලකිය යුතු බදු සහනවලට අමතරව, රජය විසින් 2020 මාර්තු මාසයේ දී ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා සහන ක්‍රියාමාර්ග කිහිපයක් ප්‍රකාශයට පත් කරන ලදී. සංචාරක, ඇඟලුම් සහ තොග හා සිල්ලර වෙළඳ අංශවල නියැලී සිටින ව්‍යාපාර සඳහා විවිධ සහන, තෝරාගත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ ඇතැම් වෛද්‍ය භාණ්ඩ සඳහා උපරිම සිල්ලර මිල ගණන් හඳුන්වා දීම සහ අඩු ආදායම්ලාභී හා අවදානමට ලක්විය හැකි පවුල් සහ පුද්ගලයින් සඳහා එකවර ගෙවීමක් ලෙස ලබාදෙන රු. 5,000ක දීමනාව මෙම ක්‍රියාමාර්ග අතර විය. තවද, කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම පාලනය කිරීමේ නිරත වී සිටින සියලු සෞඛ්‍ය, පොලිස්, සිවිල් ආරක්ෂක සේවා නියුක්තයින්ගේ හා රාජ්‍ය සේවකයින්ගේ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභය දෙගුණයක් කරන ලදී. මේ අතර, වෛරසයේ ව්‍යාප්තිය මර්ධනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීමට සහ දීර්ඝ කාලයක් තිස්සේ හිඟ ගෙවීම් නිසා පීඩාවට පත් ව්‍යාපාරවල ද්‍රවශීලතාවය සහතික කිරීමට රජය විසින් ඉක්මන් ක්‍රියාමාර්ග ගන්නා ලදී. එනම් රජය විසින් ඖෂධ මිල දී ගැනීමට සහ පොහොර මිල දී ගැනීමට අදාළ ප්‍රසම්පාදන බිල්පත් පියවීම සඳහා පෞද්ගලික ආයතනවලට සහ සුළු හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු හිඟ මුදල් වෙන්කිරීම වැනි ක්‍රියාමාර්ග මීට ඇතුළත් විය. තවද වසංගතය පැතිරයෑම වැළැක්වීමට පියවර ගැනීම වෙනුවෙන් රජය රු. මිලියන 500ක අතිරේක මුදලක් වෙන් කරන ලදී. තවද, අවශ්‍ය සෞඛ්‍යාරක්ෂණ සහ සහන ක්‍රියාමාර්ග ගැනීමට උපකාරී වීම සඳහා කොවිඩ්-19 සෞඛ්‍යාරක්ෂණ සහ සමාජ ආරක්ෂණ අරමුදල පිහිටු වූ අතර වසංගතය පැතිරීම වැළැක්වීමට සහාය වීම සඳහා රු. මිලියන 100ක ආරම්භක මුදලක් තැන්පත් කරමින් ජනාධිපති අරමුදල විසින් විශේෂ බැංකු ගිණුමක් විවෘත කෙරිණි. ජාත්‍යන්තර

වෙළඳපොළේ සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇති ඛනිජ තෙල් මිල ගණන්වලින් ප්‍රතිලාභ ලබමින් මාස හයක් තුළ රු. බිලියන 200ක මුදලක් රැස්කිරීමේ ඉලක්කය ඇතිව රජය විසින් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල පිහිටුවනු ලැබිණි. එකතු කළ අගය මත බදු (VAT) ගෙවීමේ දී ව්‍යාපාර ආයතන මුහුණපාන අපහසුතාවය පිළිබඳ සැලකිල්ලට ගනිමින්, 2020 පෙබරවාරි සහ මාර්තු මාසයන්ට අදාළ එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා අප්‍රේල් 30 දක්වා සහන කාලයක් ලබා දෙන ලදී. ජාතික අවශ්‍යතාව සළකා රජයට සෘජුවම මුදල් සපයන ලද අතර ම, උද්ධමනය අඩු අගයක පවත්වා ගැනීම තුළින් අවශ්‍ය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම සඳහා පැවති අවකාශය සහ බැංකු අංශයේ සම්මතයන්ට ඉහළින් පවත්වා ගත් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා ආරක්ෂණ මට්ටම් තුළින් මූල්‍ය අංශයේ ඇති කර ගත් අවකාශ ද ප්‍රයෝජනයට ගනිමින්, සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ වුවද ඉහත සඳහන් සහන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා රජය ගන්නා උත්සාහයන්ට සහය වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය.

## ඉදිරි දැක්ම

මෙම කොවිඩ්-19 වසංගතයේ ස්වභාවය අනුව ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්යසාධනය කෙරෙහි එහි බලපෑම අවිනිශ්චිත සාධක කිහිපයක් මත රඳා පවතී. දේශීය හා ගෝලීය ආර්ථිකයන්ට අදාළ වන පරිදි, වසංගතය තවදුරටත් ව්‍යාප්ත වීම, වසංගතය ව්‍යාප්තවීම අවම කිරීමට ගන්නා පියවරවල ස්වභාවය සහ කාර්යක්ෂමතාව, සැපයුම් අංශයේ ඇති විය හැකි බිඳවැටීමේ ප්‍රමාණය සහ චර්යාත්මක වෙනස්කම්හි හා වෙනත් ආර්ථික රටාවන්හි කල් පැවැත්ම ඒ අතර වේ. ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම මන්දගාමීව සිදු වන තත්ත්වයක් තුළ, ශ්‍රී ලංකාවේ දේශීය ඉල්ලුම සමස්ත ඉල්ලුමේ සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කරන බැවින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්ත්වයට රැගෙන ඒමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම තුළින් ශ්‍රී ලංකාව මෙම වසංගතයෙන් මිදී නැවත යථා තත්ත්වයට පැමිණීම ඉක්මන් වනු ඇත.